# වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව

**2025 වර්ෂයේ/ 09 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්ථාව**

**2025.12.16**

පැමිණීම

1. ගරු සභාපති ටී.බී.ඩී ඇන්ටනී කුමාර් මයා
2. ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා
3. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා
4. ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා
5. ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා
6. ගරු මන්ත්‍රී බී. ඇන්ටනී සුනිල් සාන්ත පෙරේරා මයා
7. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා
8. ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය
9. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය
10. ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා
11. ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා
12. ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා
13. ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා
14. ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා
15. ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය
16. ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා
17. ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා
18. ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා
19. ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා
20. ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය
21. ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය
22. ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා
23. ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා
24. ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා
25. ගරු මන්ත්‍රී ඒ.ඒ.චොහාන් සන්දීප් මයා
26. ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා
27. ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය
28. ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණි රෙක්ස් ප්‍රනාන්දු මයා
29. ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා

30. ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා
31. ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා
32. ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා
33. ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රිට් මිය
34. ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය
35. ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය
36. ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා
37. ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා
38. ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා
39. ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා

<u>නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

1. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා
2. ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා
3. ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා
4. ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය
5. ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා

මෙදින පෙ.ව 9.00ට මහ සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති ටී.බී.ඩී. ඇන්ටනී කුමාර් මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

**1. 2025.11.11 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.**

2025.11.11 දිනැති මහ සභා වාර්තාව සත්‍යයක් බව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා විසින් යෝජනා කල අතර එම යෝජනාව පහත සඳහන් සංශෝධන වලට යටත්ව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

**2025.11.11 දින පැවති මහ සභා රැස්වීම් වාර්ථාවේ සංශෝධන :-**

<u>පිටු අංක 31</u>

ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මහතාගේ පුතණුවන් මීට පෙර ප්‍රාදේශිය සභා මන්ත්‍රිවරයෙකු ලෙස සේවය කර ඇති අතර අදාල මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ප්‍රදේශවාසින් එම මන්ත්‍රිවරයාගෙන් ඉල්ලීම් කලත් එම සිදු නොමැති නමුත් වර්තමාන අණ්ඩුව බලයට පත් වී මාස 06ක් ඇතුලත ප්‍රදේශවාසින්ගේ ඉල්ලීම මත එම මාර්ගට ප්‍රතිසංස්තරණය කර දීමට හැකි වූ බව පවසන ලදි. ඒ අනුව එම නිවැරදිව සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා පවසන ලදි.

<u>පිටු අංක 24</u>

වොළිබෝල් තරඟාවලියක් සඳහා වෙන් කර ඇති මුදල රු.20,000.00ක් නොව රු.200,000.00ක් ලෙස සංශෝධනය විය යුතු අතර කාන්තා හා ළමා අභිවෘද්ධි වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල රු.400,000.00ක් නොව රු.300,000.00ක් ලෙස සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය පවසන ලදි.

ඉන්පසු ගංවතුර ආපදා තත්වය හේතුවෙන් පීඩාවට පත් සියලුම ශ්‍රී ලාංකික ජනතාව මෙන්ම වෙන්නප්පුව බල ප්‍රදේශය තුල ඉතාමත් කණගාටුදායක ලෙස හෙලිකොප්ටර් රථය කඩා වැටීම නිසා මිය ගිය අප බල ප්‍රදේශයට අයත් එම මහතා වෙනුවෙන් විනාඩි දෙකක නිශ්ශබ්දතාවයක් රකින ලදි.

**2. ගරු සභාපති තුමාගේ විශේෂ නිවේදන.**

i. ගංවතුර ආපදා තත්වය නිසා බල ප්‍රදේශයේ පවුල් 7388ක් ආපදාවට පත් විය. සම්පූර්ණයෙන්ම හානියට පත් වූ නිවාස ගණන 61කි. ජීවිත හානි 02ක් සිදු විය. ප්‍රාදේශිය සභා මාර්ග කිහිපයකට හා සභාවට අයත් ගොඩනැගිලි කිහිපයකට හානි සිදු වී ඇත. ආපදා තත්වයෙන් ජනතාව බේරා ගැනීම සඳහා ප්‍රදේශයේ ධීවරයින්ගේ බෝට්ටු සේවාව ලබා ගැනීමට සිදු විය. ඊට අමතරව මාර්ග වලට හා විදුලි රැහැන වලට ගස් වැටීම නිසා ගස් කපන යන්ත්‍රයක් මිලදී ගැනීමට සිදු විය. ඒ සඳහා වෙන්නප්පුව වෙළඳ සංගමය විසින්ද ගස් කපන යන්ත්‍රයක් පරිත්‍යාග කර ඇත.

ii. විපතට පත් ජනතාවට ආහාර සැපයීම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක වුවත් අවශ්‍ය අවස්ථාවලදී වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ සහයෝගයද ලබා දෙන ලදි.

iii. ආපදාවට පත් වූ නිවාස වලින් බැහැර කරන කසල සභාව සතු යන්ත්‍රෝපකරණ හා කුලියට ලබා ගත් යන්ත්‍රෝපකරණ යොදවා ඉවත් කර දීමට පියවර ගෙන ඇත. එම කටයුතු සඳහා බාහිර ප්‍රජාවගේ සහයෝගයද ලැබී ඇත. බල ප්‍රදේශයේ අපවිත්‍ර වූ ළිං ශුද්ධ කිරීම සඳසා සභාව සතු වතුර මෝටර් හා කුලියට ලබා ගත් වතුර මෝටර් යොදා ගන්නා ලදි. එම කටයුතු සඳහාද බාහිර ප්‍රජාවගේ සහයෝගය ලැබී ඇත.

iv. බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වූ ජල සැපයුම් අක්‍රිය වීම නිසා සභාව සතු ජල බවුසර් 08ක් මගින් සේවය සැපයීමට සිදු විය. බල ප්‍රදේශයේ නිවැසියන්ගේ වතුර පිරී තිබූ වැසිකිලි ශුද්ධ කර දීම සඳහා ගලි බවුසර් සේවාවද නොමිලේ ලබා දෙන ලදි. ආපදා ඇති වූ අවස්ථාවේ සිට මේ දක්වා කටයුතු සඳහා ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීමණ්ඩලයෙන් ලැබුනු සහයෝගය ඉතා අගය කොට සලකමි. කාර්ය මණ්ඩලය වෙතින් ලැබුනු සහයෝගයද ඉතා අගය කොට සලකමි. ස්වේච්ඡා සංවිධාන වලින් හා පරිත්‍යාගශීලි ජනතාව වෙතින් ලැබුනු සහයෝගය ඉතා අගය කොට සලකමි. ආපදාවට පත් වී සිටින ජනතාව යථා තත්වයට පත් කිරීම සඳහා ඔබ සියලු දෙනාගේ සහයෝගය තව දුරටත් අපේක්ෂා කරමි.

v. වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය අරමුදලින් ආධාර ලබා දීමට අදාල විස්තර පත්‍රිකාව හා අයදුම්පත්‍ර සියලුම මන්ත්‍රීතුමන්ලා වෙත ලබා දීමට කටයුතු කර ඇත.

vi. වෙන්නප්පුව ලුණුවිල මාර්ගයේ පාලම් දෙක අසලට විදි පහන් සවි කිරීම සඳහා විදි පහන් කණු සැපයූ නෙවිල් පෙරේරා මහතා වෙතත් එම කටයුතු සම්බන්ධීකරණය කල ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මහතාට ස්තූතිය පුද කර සිටිමි. වෙන්නප්පුව නගරයට අලුත් විදි පහන් කට්ටල සැපයූ වෙන්නප්පුව ගොඩනැගිලි හිමියන්ගේ සංගමය හා ව්‍යාපාරික ප්‍රජාව වෙතද ස්තූතිය පුද කර සිටිමි.

## 3. පෙත්සම්, පැමිණිලි හා ලිපි ඉදිරිපත් කිරීම.

- නැත

## 4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

<u>ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා</u>

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ආර්.ෂවීන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රමාලතා මිය, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීඩ් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රත්තිලක මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා යන මන්ත්‍රීවරුන් 19දෙනා වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවේ පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව වෙත යොමු කර ඇති,

i. ඉල්ලීම් (යෝජනා) ලිපි ගණන කොපමණද?
   - 7

ii. මේ වන තෙක් එයින් කීයක් ඉටුකර තිබේද?
   - 3ක් ඉටු කර ඇත. ඉතිරි යෝජනා ඉදිරි වර්ෂයේ අයවැය ප්‍රතිපාදන මත ඉටු කිරීමට අපේක්ෂිතව ඇත.

iii. එකී යෝජනා ඉටුකරලීමට මැලිකමක් දක්වන්නෙ මන්ද?
   - යන්ත්‍ර හා සේවකයින් යෙදවිය හැකි ධාරිතාවය මත යෝජනා වශයෙන් ඉදිරිපත් වූ ඉල්ලීම් ඉටු කිරීමට කටයුතු සලසා ඇත

## 5. යථා පරිදි කල් දී ඇති යෝජනා

1) කාරක සභා පත් කිරීම හා ඊට අදාල බලතල පැවරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

   a. මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව
   b. කාර්මික සේවා කාරක සභාව
   c. ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව
   d. පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව
   e. පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව

2) ටෙන්ඩර් මණ්ඩලය පත් කිරිමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ඉහත යෝජනාවට එකඟ නොවන බැවින් ඡන්ද විමසීමක් ඉල්ලා සිටින ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ පෙර සභා වාරයේදි මෙන්ම මෙම සභා වාරයේදිද විපක්ෂයේ එක් සාමාජිකයෙකුට ටෙන්ඩර් මණ්ඩලයේ සාමාජිකත්වය ලබා දීමට හැකි බව යෝජනා කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් විපක්ෂය යනු පක්ෂ කිහිපයක සංයුතියක් වන බැවින් එක් එක් පක්ෂ වලින් එක් සාමාජිකයෙකු බැගින් ටෙන්ඩර් මණ්ඩලය නියෝජනය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාවට අනුව විපක්ෂයෙන් එක් සාමාජිකයෙක් ලබා දීමට එකඟ නොවන බව පවසන ලදි. ඉන් පසු ඉහත යෝජනාව සඳහා ඡන්ද විමසීමක් සිදු කරන ලදි.

ඒ අනුව ටෙන්ඩර් මණ්ඩලය පත් කිරිමට පක්ෂව ගරු සභාපති ටී.බී.ඩී.ඇන්ටනි කුමාර් මහතා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා , ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය, ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා, ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මයා, ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා ඡන්දය ප්‍රකාශ කල අතර, ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රිට් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදි. ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රී

ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය සහ ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.ෂවීන් ප්‍රනාන්දු මයා එදින මහ සභාවට නොපැමිනෙන ලදි. ඒ අනුව පැමිණ සිටි මන්ත්‍රිමණ්ඩලයේ ඡන්ද 03කින් යෝජනාව සම්මත විය.

ටෙන්ඩර් මණ්ඩලය සඳහා විපක්ෂයෙන් එක් මන්ත්‍රිවරයෙකුට අවස්ථාව ලබා දීමට අදාලව ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන්ද ගරු උප සභාපතිතුමා විසින් ඡන්ද විමසීමක් ඉල්ලා සිටින ලදි. ඒ අනුව යෝජනාවට පක්ෂව ගරු සභාපති ටී.බී.ඩී.ඇන්ටනි කුමාර් මහතා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී සී.ජූඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා , ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය, ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා, ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මයා, ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණී රෙක්ස් ප්‍රනාන්දු මයා සහ ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කල අතර, ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදි. ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා, සහ ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.ෂවීන් ප්‍රනාන්දු මයා එදින මහ සභාවට නොපැමිනෙන ලදි. ඒ අනුව පැමිණ සිටි මන්ත්‍රිමණ්ඩලයේ ඡන්ද 03කින් යෝජනාව සම්මත විය.

3) 2026 වර්ෂයට අදාල සැලසුම් අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

   a. කාර්ය සාධන සැලසුම
   b. ක්‍රියාකාරි සැලසුම
   c. අභ්‍යන්තර විගණන සැලසුම
   d. පුහුණු සැලසුම
   e. ප්‍රසම්පාදන සැලසුම
   f. ආපදා සැලසුම

4) 6 වන පරිපූරක ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| ආදායම් උපයා ගන්නා අය විෂය | | | | ප්‍රතිපාදන වෙන් කරන වැය විෂය | | | |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන | අය විෂය | අය විෂය විස්තරය | ආදායම් ඇස්තමේන්තුව රු. ශත | වැඩසටහන | වැය විෂය | වැය විෂය විස්තරය | වියදම් ඇස්තමේන්තුව රු. ශත |
| සෞඛ්‍ය සේවා | 281-02-00-00-81-i (පළාත් සභා ප්‍රාග්ධන ආධාර) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන (වාර්ෂික සංවර්ධන සැලැස්ම- සන අපද්‍රව්‍ය කළමණාකරනය) | 1,500,000.00 | සෞඛ්‍ය සේවා | 281-02-03-00-09-02 යන්ත්‍ර හා උපකරණ | බේල් යන්ත්‍රයක් මිලදී ගැනීම | 1,500,000.00 |
| එකතුව | | | **1,500,000.00** | | | | **1,500,000.00** |

5) 2026 රැස්වීම් කාලසටහන අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි. එහිදි 2026.04.14 දින නොව 2026.04.07 දිනට සංශෝධනය විය යුතු බව පවසන ලදි. එමෙන්ම 2026 වර්ෂයේ සිට මහ සභාව පැවැත්වෙන වේලාව පෙ.ව 9.30 බව සංශෝධනය කරන ලදි. එම සංශෝධනයන්ට යටත්ව ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා ඉහත යෝජනාව ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| මාසය | දිනය |
|---|---|
| ජනවාරි | 2026.01.13 |
| පෙබරවාරි | 2026.02.10 |
| මාර්තු | 2026.03.10 |
| අප්‍රියෙල් | 2026.04.07 |
| මැයි | 2026.05.12 |
| ජුනි | 2026.06.09 |
| ජූලි | 2026.07.14 |
| අගෝස්තු | 2026.08.11 |
| සැප්තැම්බර් | 2026.09.08 |
| ඔක්තෝම්බර් | 2025.10.13 |
| නොවැම්බර් | 2025.11.10 |
| දෙසැම්බර් | 2025.12.08 |

6) කොන්ත්‍රාත් පදනම මත බදවාගෙන ඇති සේවකයින්ගේ දෛනික වැටුප රු.2000.00 දක්වා වැඩි කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, කොන්ත්‍රාත් පදනම මත බදවාගෙන සිටින සෞඛ්‍ය කම්කරුවන් 13 සේවය කරන අතර මේ වන විට ඔවුන්ට ලැබෙන් වැටුප ප්‍රමාණවත් නොවන බැවින් එම වැටුප් වැඩි කර දෙන ලෙස ඉල්ලීම් කර තිබුනු අතර එය 2026 වර්ෂයේ ජනවාරි සිට වැඩි කරන බවට පොරොන්දු වූ බව පවසන ලදි. ඒ අනුව ඊට අදාලව මෙම යෝජනාව මහ සභාවට ඉදිරිපත් කල බව පවසන ලදි. ඒ අනුව රු.2000.00ක් දක්වා ඔවුන්ගේ වැටුප වැඩි කල බව පවසන ලදි.

ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා කතා කරමින්, රු.1500.00ක්ව පවතින කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ප්‍රාදේශීය සභාවේ සහෝදරයින්ගේ වැටුප රු.500.00කින් වැඩි කිරීම පිළිබඳ ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන ලදී. එම සේවක පිරිස 2023 සිට බඳවාගෙන ඇති අතර අවුරුදු 02ක කාලයක් දක්වාම පවතින ආර්ථික දුෂ්කරතා මැද රු.1500.00ක වැටුපක් ලබමින් සේවය කළ බව පවසන ලදී. පොහොසත් රටක් ලස්සන ජීවිතයක් තේමාව කර ගනිමින් ආරම්භ කළ වැඩසටහනේ දී මේ වන විට රටේ වැඩ කරන සියලුම කම්කරු පන්තියට සාධාරණ වැටුප් වැඩි කිරීමක් අතිගරු ජනාධිපතිතුමාගේ සිට ලබා දුන් බව පවසන ලදී. එමෙන්ම වතුකම්කරුවන්ගේ දෛනික වැටුප රු. 1700.00ක් දක්වා වැඩි කළ අතර, රට පුරා දුක් විඳින කම්කරු ජනතාව ඒ වෙනුවෙන් ප්‍රීතිය සැමරූ බව පවසන ලදී. පෞද්ගලික අංශයේ වැටුප රු.30,000.00ක් දක්වා වැඩිකර ඇති අතර වැඩ කරන පංතිය ගැන සිතන රටක් හා රාජ්‍ය නායකයෙක් සහිත දේශපාලනයක් මේ රටේ බලය ලබාගත් පසුව ධනපති පංතියේ ඇතැම් දේශපාලඥයින් තම කුහකකම් ප්‍රදර්ශනය කළ බව පවසන ලදී. වැඩ කරන පංතිය නියෝජනය කරන කම්කරු පන්තියක් ලෙස රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික යන සියලුම ක්ෂේත්‍රවල වැටුප් වැඩි කිරීම් කළ අතර ඊට සමගාමීව ප්‍රාදේශීය සභාවක් ලෙස කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින්ගේ වැටුපද වැඩි කිරීම පිළිබඳ නැවතත් ගරු සභාපතිතුමා හට හා ලේකම්තුමාට ස්තුතිය පුද කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටියේ ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා කතා වේගවත්ව කතා කළ නමුත් එසේ කතා කළ යුත්තේ ආණ්ඩු පක්ෂ නොව විපක්ෂය බවයි. එයට හේතුව මෙම වැටුප රු.500කින් නොව රු.1000කින් වැඩි විය යුතු බව පවසන ලදී. ආණ්ඩු පක්ෂයේ බලය ලබා ගෙන වසරක් අවසන් වී ඇති අතර හාල්, කිරිපිටිවල මිල පැවති මිලට වඩා වැඩි වී ඇති බව පැවසූ අතර වතුකරයේ ජනතාවගේ වැටුප වැඩි කිරීම පිළිබඳ මීට පෙර ආණ්ඩුව පැවති සමයේදීත් කතා කල අතර දැනට වැඩි කර ඇති මුදලද ප්‍රමාණවත් නොවන බව පවසන ලදී. එමෙන්ම ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා පැවසූ කරුණු සම්බන්ධයෙන් උදම් අනන්නට දෙයක් නොමැති අතර ආණ්ඩු පක්ෂය බලයට පැමිණ වසරක් ගිය පසු ජීවන අංකය වැඩි වීම මෙම ගැටලුවට හේතුව බව පවසන ලදී.

ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මහතා කතා කරමින්, අදාල සේවකයින්ගේ වැටුප රු.2500.00ක් දක්වා වැඩි කල යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා පවසා සිටියේ "එක් පැන් තුඩෙන් හාල් මිල අඩු කරනවා" යනුවෙන් ගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශනයක් කළ බව පැවසූ නමුත් වර්තමානය වන විට හාල් මිල රුපියල් 20කින් වැඩි කර ඇති බව පවසන ලදී. දූෂණය පිළිබඳ කතා කරන නමුත් තවමත් හාල් මිල පහත දැමීමට රජයට නොහැකි වී ඇති අතර බඩු මිල ඉහළ ගොස් ඇති මොහොතක සේවකයකුට රු.2000.00ක් ප්‍රමාණවත් නොවන බව පවසන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා කතා කරමින්, මීට පෙරදීත් සභාපතිවරු පාලනය කළ අතර වැටුප් වැඩි නොකළේ මන්දැයි විමසන ලදී. 66ක් අතිරික්ත සේවකයින් සිටින අතර එකල වැඩි කළ මුදල මූලික වැටුප් වලට එකතු කළ නොකළ බව පවසන ලදී. එමෙන්ම එම මුදල අතිකාල දීමනා සඳහාවත්, ණයක් ගන්නා අවස්ථාවකදීවත් එකතු නොකළ බව පවසන ලදී. එමෙන්ම විපක්ෂ මන්ත්‍රීවරු විසින් ඉතිහාසයේ සිට පාලනය කළ සභාපතිවරුන් පිළිබඳ කතා කළත් ඒ කිසිදු දේකට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විරුද්ධ නොවූ අතර නිශ්ශබ්දව සියලු දේ අසා සිටි බව පවසන ලදී. ඒ අනුව මහා සභාවක් තුළ කතා කිරීමේදී සංවරව හා අසුනෙන් නැගිට මහ සභාව ඇමතීමට ඉගෙන ගන්නා ලෙස පවසන ලදි. නවක මන්ත්‍රිවරුන්ට ජ්‍යෙෂ්ඨ මන්ත්‍රිවරුන් ආදර්ශයක් විය යුතු අතර වැදගත් ලෙස හැසිරෙන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, සේවකයින් බඳවාගෙන ඇත්තේ 2023 වර්ෂයේ සිට වන අතර වෙනත් සභාපතිවරයෙකුට එම සේවකයින්ගේ වැටුප් වැඩි කිරීමට අවස්ථාවක් නොතිබුනු අතර එම අවස්ථාවක් දැන් පවතින්නේ වත්මන් ගරු සභාපතිතුමාට බව පවසන ලදී. වර්තමානයේ

පෙදරේරුවෙකුට පවා රු.3000-3500ක් ගෙවන මොහොතක වෙහෙස මහන්සි වී වැඩ කරන සෞඛ්‍ය කම්කරුවන්ගේ වැටුප රු.500.00කින් වැඩි කිරීම ප්‍රමාණවත් නොවන බව පවසන ලදී.

ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉහත යෝජනාව ස්ථිර වී ඇති අතර රු.1500.00 මුදල රු.2000.00 දක්වා වැඩි කරුනුයේ අයවැය වාර්තාවට අනුව බව පවසන ලදි. පෙර සිටි ජේෂ්ඨ මන්ත්‍රීවරු මැරිල ඉපදුණා සේ කතා කිරීම පුදුමයක් වන අතර දශක ගණනාවක් මේ රටේ මිනිසුන්ගේ ගැටළු වලට පිළිතුරු නොසෙවූ අය වසරක කාල සීමාව පිළිබඳ ප්‍රශ්න කිරීම විහිළුවක් වන බව පවසන ලදී. රාජ්‍ය සේවකයින්ගේ වැටුපට 35%ක කොටසක් 2026 ජනවාරි මාසයේදී එකතු වන බවද පවසන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් සිදු කරන ලදි. ඒ අනුව යෝජනාවට පක්ෂව ගරු සභාපති ටී.බී.ඩී.ඇන්ටනි කුමාර් මහතා, ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා, ගරු මන්ත්‍රී කේ.ඩිලාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ. විමුත් සුසන්ත අප්පුහාමි මයා, ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා, ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය, ගරු මන්ත්‍රී සී.ජුඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා , ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා, ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා, ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා, ගරු මන්ත්‍රිනී එල්.ජයංගා රුවනාරි ප්‍රනාන්දු මිය, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මිය, ගරු මන්ත්‍රී එම්.සුරංගා රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා, ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී ඒ.ඒ.චොහාන් සන්දීප් මයා, ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා, ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය, ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණි රෙක්ස් ප්‍රනාන්දු මයා සහ ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා ඡන්දය ප්‍රකාශ කල අතර, ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී බී.ඒ.එස්. සාන්ත පෙරේරා මයා, ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා, ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය, ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය, ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයා, ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා, ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.අජිත් අමරජීව මයා, ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රිට් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය, ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රත්තිලක මිය, ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා, ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා, ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා සහ ගරු මන්ත්‍රී ඩබ්.විමලසිරි පෙරේරා මයා යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදි. ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා, ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය, ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා, සහ ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.ෂවීන් ප්‍රනාන්දු මයා එදින මහ සභාවට නොපැමිනෙන ලදි. ඒ අනුව පැමිණ සිටි මන්ත්‍රිමණ්ඩලයේ ඡන්ද 03කින් යෝජනාව සම්මත විය.

7) 2026 සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනය අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා විසින් සිථිර කරන ලදි.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා කතා කරමින්, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේදී ඉතාමත් සීමිත ප්‍රමාණයක් ඉල්ලුම් කර ඇති බව පවසන ලදී. එයට හේතුව පසුගිය කාල වකවානුවල සිටි සභාපතිවරුන්ගේ හිතවතුන් හා තමන්ගේ පාක්ෂිකයන් බඳවාගෙන ඇති අතර අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ට ලියාපදිංචි වීමට අවස්ථාවක් ලබා නොදී ඇති බවයි. වෙන්නප්පුව ආසනයේ සිටින කොන්ත්‍රරත්කරුවන් නාත්තන්ඩිය හා දන්කොටුවට ගොස් ලියපදිංචි වී ඇති බව පවසන ලදී. එහෙත් නව ආණ්ඩු පක්ෂය බලයට පැමිණි පසු හිතවතුන්ට නොව සියළුම දෙනාට ලියාපදිංචි වීමට විනිවිදභාවයකින් යුතුව අවස්ථාව ලබා දුන් බව පවසන ලදී. ඒ අනුව මේ වන විට කොන්ත්‍රාත්කරුවන් 25ක් ලියාපදිංචි වී සිටින බව පවසන ලදී.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා කතා කරමින්, උප සභාපතිතුමා විසින් කළ ප්‍රකාශය අසත්‍ය වන අතර එවකට ආණ්ඩු පක්ෂය බලය ලබා ගත් මොහොතේ සභාව සතුව මුදල් නොතිබුණු අතර පළාත් සභාව සමග එකතු මුදල් ලබාගෙන අසීරුවෙන් ඉදිරියට ගිය බව පවසන ලදී. කොන්ත්‍රාත්කරුවන් සැමවිටම කැමති වූයේ ඔවුන්ගේ මුදල් විගස ලබා දෙනවාට වුවත් එවන් ස්ථාවර තත්වයකට ප්‍රාදේශය සභාව ගෙන ඒමට හැකි වූයේ 2022-2023 වර්ෂවල බව පවසන ලදි. ඒ අනුව ගරු උප සභාපතිතුමා විසින් කල ප්‍රකාශය වැරදි ප්‍රකාශයක් බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කතා කරමින්, පසුගිය කාලවකවානුවේදී කර්මාන්ත කමිටු සභාපතිවරයා ලෙස එතුමා කටයුතු කළ අයෙක් වන අතර වර්තමානයේදී කර්මාන්ත කමිටුවේ සභාපතිවරයා වන ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා විසින් කළ චෝදනාව පදනම් විරහිත චෝදනාවක් බව පවසන ලදී. එයට හේතුව කර්මාන්ත ටෙන්ඩර් කළ අතර එය කර්මාන්තකරුවන්ගෙන් ලැයිස්තුවට ලගු නොවන බව පවසන ලදී. එමෙන්ම එකල විවෘත මිල ගණන් කැඳවීමක් තිබූ බව පැහැදිලි කරන ලදී. ඒ අනුව උප සභාපතිතුමා විසින් වැරදි මතයක් සභාගත කරන බව පවසන ලදී. එමෙන්ම කුමන හෝ කොන්ත්‍රාත්කරුවෙක් පසුගිය කාල සීමාවේදී වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් නාම ලේඛණයට ඇතුළත් කරන ලෙස ඉල්ලීම් කළත්, ප්‍රතික්ෂේප වී ඇති කවුරුන් හෝ සිටී නම් සභාව ඉදිරියේ පවසන ලෙස අභියෝග කරන ලදී. එමෙන්ම එදා ලැයිස්තුව සහ වර්තමාන ලැයිස්තුව සංසන්දනය කර වගකීමකින් යුතුව අදහස් ප්‍රකාශ කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, පෞද්ගලිකව කිසිදු අයෙකුට මඩ ගැසීමක් නොකරන බව ප්‍රකාශ කළ අතර මීට පෙර පැවැති ආණ්ඩුව සමඟ උප සභාපතිතුමාද කොන්ත්‍රාත්කරුවකු ලෙස කටයුතු කර ඇති නමුත් වර්තමානයේදී අතීතය සලකා බලා පක්ෂග්‍රාහීව කටයුතු නොකරන ලෙස පවසන ලදී.

ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මහතා කථා කරමින්, විවෘත මිල ගණන් කැඳවීමේදී එහි ප්‍රමාණයක් ඇති අතර ඒ සියලුම ප්‍රමාණයන් සඳහා මිල ගණන් කැඳවා නොතිබුණු අතර මිලියන 10 ඉක්මවා ඉක්මවා ගිය පසු පමණක් විවෘත මිළ ගණන් කැඳවීමක් සිදුකළ අතර එවකට ඉතාමත් සීමිත ප්‍රමාණයක් පමණක් සිටි බව පවසන ලදී. එමෙන්ම ඉල්ලුම් කර තිබියදී ප්‍රතික්ෂේප කල කොන්ත්රාත්කරුවකුගේ නමක් එම මොහොතේදී ලබාදීමට නොහැකි නමුත් ඉදිරියේදි ලබා දීමට කටයුතු කරන බව පවසන ලදී.

සෝෂාව

මේ පිළිබඳ පැහැදිලි කිරීමට ලේකම්තුමාට අවස්ථාවක් ලබා දීමට මහ සභාව අවස්ථාව කාරක සභා අවස්ථාක් බවට පත් කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඇලේක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී. ඉන්පස මේ පිළිබඳව ලේකම්තුමා විසින් පැහැදිලි කරන ලදි. නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

8) 2026 සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

9) දංකොටුව නව වෙළඳ සංකීර්ණය 01 අදියර පළමු මහළ පිටුපස අංක 10 කඩකාමරය හිඟ මුදල් අය කර අවම ලංසුවට බදු ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී අයි.පී. ප්‍රගීත් ධර්මජීව මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

10) දංකොටුව නව වෙළඳ සංකීර්ණයේ 02 වන අදියරයේ පළමු මහළ අංක 03 කඩ කාමරට ඒ.එම්.පුෂ්පා කුමාර අධිකාරි යන අයට වසර 03කට පවරා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඕ.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

11) ධීවර තොටුපළවල් විදුලි ආලෝකකරණය කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.එල්.සමන් රෝහිත මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මහතා කතා කරමින්, මේ වන විට ධීවර තොටුපළවල් 11ක් ඇති අතර උල්හිටියාව හා කොලින්ජාඩිය අතර වැඩිම තොටුපළවල් ප්‍රමාණයක් ඇති අතර බලයට පත්වූ කාලවකවානුව තුළ මෙම තොටුපොළවල් නඩත්තු කිරීම සම්බන්ධයෙන් ඉතා අසීරුතාවයකට පත් වූ බව පැවසූ අතර ඇතැම් තොටුපලවල් පිළිසකර කිරීමට විශාල කාලයක් ගත වන අතර නිසි ක්‍රමවත්භාවයකින් තොරව විදුලි රැහැන් යොදා ඇති බවත්, මුහුදු ලුණු වැදීම නිසා එම විදුලි රැහැන් පද්ධති අබලන් තත්වයක පවතින බවත් පවසන ලදී. එම නිසා මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට යම් මුදල් ප්‍රමාණයක් වෙන්වී ඇති බව පවසන ලදී.

ගරු සභාපතිතුමා පවසා සිටියේ ධීවර තොටුපළවල් 11ක් ඇති බැවින් ඒවා අදියරයෙන් අදියර එකින් එකට විදුලි සැපයීමක් කිරීමට අවශ්‍ය බවයි. ඒ අනුව 2026 වර්ෂයේ උපරිම ලෙස පියවරෙන් පියවර අවශ්‍ය කටයුතු ගැනීමට බලාපොරොත්තු අමාත්‍යංශ මට්ටමින් ද මෙම ව්‍යාපෘතිය සඳහා සහනයක් ලබා ගැනීමට හැකි බව පවසන ලදී.

12) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට උපකරණ ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මහතා කතා කරමින්, 2025 වසරේ සිට විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට සහ තාවකාලික ආබාධිත පුද්ගලයින්ට රෝද පුටු යනාදී ලබා දීමට විවිධ ඉල්ලීම් ඉදිරිපත් වී ඇති අතර ප්‍රාදේශ ලේකම් කාර්යාල මගින් තාවකාලිකව මෙම උපකරණ ලබා දීමට ක්‍රියාත්මක වී ඇති බව පවසන ලදී. අවශ්‍යතාවය අවසන් වූ පසු නැවත එම පුද්ගලයින් විසින් නැවත එම උපකරණ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ලබා දුන් නමුත් මේ වන විට ප්‍රාදේශ ලේකම් කාර්යාල සඳහා පවතින උපකරණ සීමිත බව පවසන ලදී. එම නිසා ප්‍රාදේශීය සභා සතු ප්‍රතිපාදනය ඒ සඳහා යොමු කිරීමට තීරණය කළ බව පවසන ලදී. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ලෙස ප්‍රදේශයේ කවුරුන් හෝ එවැනි ආබාධිත තත්වයකට මුහුණ පා සිටී නම් තාවකාලික පදනම් මත අවශ්‍ය උපකරණ ලබාදීමක් සිදුකරන අතර නිරෝගී වූ පසු නැවත එම උපකරණ වෙන්නප්පුව ප්‍රාදේශිය සභාවට භාරදෙන බව පවසන ලදී.

13) පුත්තලම් දිස්ත්‍රික් ප්‍රවීණයන්ගේ මළල ක්‍රීඩා සංගමයට විසින් පවත්වන සමස්ත ලංකා සහය දිවීමේ සැනකෙලිය සඳහා 2026.02.08 දින ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනය නොමිලේ ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා විසින්

ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

14) ආපදා තත්වයන් සඳහා ගලි බවුසරය නොමිලේ ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී සී.ජුඩ්. ප්‍රියදර්ශන ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

ගරු සභාපතිතුමා කතා කරමින්, පසුගිය ගංවතුර ආපදා තත්ත්වය හමුවේ වැසිකිළි සම්බන්ධයෙන් අපහසුතාවයට පත්වූවන්ගෙන් ඉල්ලීම් ලැබුණු අතර ගලි බවුසර් 02ම සේවයේ යෙදවූ බව පවසන ලදී. එමෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරු පවා කළ ඉල්ලීම් වලටද අවශ්‍යය කටයුතු සලසා දුන් බව පවසන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා කතා කරමින්, ගංවතුර තත්වය ලංකාව තුල මෙන්ම වෙන්නප්පුව ප්‍රදේශයටද විශාල වශයෙන් බලපෑම් කල අතර මෙම ආපදාව පිළිබඳව සහ ඉදිරියට සිදු කිරීමට ඇති දෑ පිලිබද සාකච්ඡා කිරීම සුදුසු බව යෝජනා කරන ලදි. එමෙන්ම බණ්ඩිරිප්පුව ප්‍රදේශයේ ළිං පවිත්‍ර කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාට ස්තූතිය පුද කරන ලදි. ඇතැම් පුද්ගලයින් ජනතාව පීඩාවට පත් වී සිටියදි රතු තරු තොප්පිය පළඳගෙන ජනතාව තුලට ගොස් එය පෙන්වීමට උත්සාහ කල අතර එය නොගැලපෙන දෙයක් බව පවසන ලදි. එමෙන්ම තමන්ද කොට්ඨාස භාර මන්ත්‍රීවරිය සමඟ එකතු වී සෑම විටම ජනතාවට උපකාර කල අතර කිසිදු කටයුත්තක් තනිවම නොකල අතර ජනතාවගෙන් ලකුණු ලබා ගැනීමට අරමුණක් නොමැති බව පව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, රතු තරුවට ඇතැම් අය බිය බව දන්නා අතර සුනාමිය අවස්ථාවේදි රතු තරු කණ්ඩායම විසින් විශාල සහන සේවාවක් සැපයු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ජේ.එම්.ජනක චමින්ද ජයසේකර මහතා කතා කරමින්, ආසන්න වශයෙන් 70ක් පමණ පිරිසක් රතු තරුවෙන් පැමිණ තෝප්පුතොට ප්‍රදේශයේ පවිත්‍ර කළ අතර ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මහතාගේ සහ ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතාගේ කොට්ඨාසයේ කෙළවර ගෙවල් කිහිපයකට විදුලිය ලබා දීමට කටයුතු කළ අතර පක්ෂ භේදයක් නොමැතිව විශාල වැඩ ප්‍රමාණයක් සිදු කල බව පවසන ලදි. එමෙන්ම රොලංකා හිමිකරුගේ නිවස රතු තරු කණ්ඩායමේ සාමාජිකයන් 40ක් පමණ යොදවා පවිත්‍ර කළ අතර එහිදී ප්‍රදේශයේ ජනතාව නොව කොළඹ මහ නගර සභා මන්ත්‍රීවරියක් ඇතුළු කණ්ඩායමක් සිටි අතර තෝරා ගත් නිවෙස් පවිත්‍ර කල බව පවසන ලදි. එමෙන්ම එම කණ්ඩායම තම කාර්යය නොමිලේ ලබා දුන් බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා කතා කරමින්, වැඩි පිරිසක් වයික්කාල කොට්ඨාසයේ වැඩ කළ අතර හදිසියේ ලැබුණු පණිවිඩයක් මත ඔවුන්ව නවතා තැබීමට ස්ථානයක් නොතිබුණ හෙයින් ඔවුන්ව රැගෙන වයික්කාල කන්‍යාරාමයට ගිය බව පවසන ලදී. විපක්ෂට මෙවැනි කණ්ඩායමක් නොමැති නිසා එම කුහකකම විදහපාන බව පවසන ලදි. තමන් රඟපෑමට හා ඡායාරූප සමාජ මාධ්‍යයන්ට මුදා හැරීමක් නොකළ අතර එයද ඇතැම් අයට ගැටලුවක් වූ බව පවසන ලදී. තම කොට්ඨාසයේ 70%ක-75% ක් පමණ කොටසක් පීඩාවට පත් වූ අතර දේශපාලනික ආගමික තරාතිරම් නොබලා කටයුතු කළ අතර එලෙස උදව් උපකාර කළ රතු තරු කණ්ඩායමටද ස්තූතිය පුද කරන ලදී.

ගරු මන්ත්‍රීනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය කතා කරමින්, ආපදා තත්වය තුල කිසිදු පක්ෂ භේදයක් නොමැතිව ජනතාවට උදව් කළ අතර විවිධ ආයතන සමඟ සම්බන්ධ වී ජනතාවට අවශ්‍ය ආහාර පාන සපයා දුන් බව පවසන ලදී. ඒ අනුව සෑම විටම ප්‍රජාවගේ සුභ සිද්ධිය උදෙසා කටයුතු කල බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මහතා කතා කරමින්, තමන් ඇතුළු පවුලද ගංවතුරෙන් පීඩාවට පත් වූ අතර ජලය ලබා ගැනීමට ජල බවුසරයක් එවන ලෙස ඉල්ලීම් කළද කිසිදු පිළිතුරක් නොලැබුණු බව පවසන

ලදී. එම අවස්ථාවේදී ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවිය එතැනට පැමිණි අවස්ථාවේ හිතේ තිබූ වේදනාවට සහ ආවේගය නිසා එතුමියට දෝෂාරෝපණය කල බව පැවසූ අතර ඉන් පසු එම අවස්ථාවේ ගොඩැල්ල දේවස්ථානයට ලබා දී තිබූ ජල බවුසරය ජනතාවට ලබා දුන් බව පවසන ලදී. එම අවස්ථාවේ කල දෝෂාරෝපණය සම්බන්ධයෙන් සමාව ඉල්ලා සිටි අතර ජල බවුසරය ලබා දීම වෙනුවෙන් ගරු මන්ත්‍රිනී ඩී.කේ.ඩී.අයෝධා ගිත්මි මෙනවියට ස්තුතිය පුද කරන ලදි. එමෙන්ම ඇතැම් ස්ථාන වලට ජල මට්ටම් පහල බැසීමටත් පෙර ගලි බවුසරය යවා සුද්ධ පවිත්‍ර කර ඇති නමුත් එය ප්‍රායෝගික නොවන බව පැවසූ අතර එය සභාවේ මුදල් අපතේ යාමක් බව පවසන ලදී. ඉදිරියේදී අවශ්‍යතාවය ඇති අයෙක් සිටී නම් ඉල්ලීම පරිදි ගංවතුරට හසුවූ කලාපයේ සිටින අයෙක් වේ නම් පමණක් ගලි බවුසරය මාසයක් පමණ කාලයක් නොමිලේ ලබාදීම සුදුසු බවට යෝජනා කරන ලදී. එමෙන්ම ගංවතුරෙන් පීඩාවට පත්වී සිටි තමන් ඇතුළු ජනතාවට උදව් උපකාර කළ ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මියට ද ස්තුතිය පුද කරන ලදී.

ගරු මන්ත්‍රි එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා කතා කරමින්, පසුගිය කාල වකවානුවලදී සුනාමි ව්‍යසනය හා කොරෝනා ව්‍යසනය හමුවේ ජනතාවට උපකාර කළ අතර මෙම ගංවතුර ආපදා මොහොතේදීත් විපක්ෂයක් ලෙස නොසිතා ජනතාවට උදව් උපකාර කළ බව පවසන ලදී. එමෙන්ම ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය ඉදිරිපත් වී විශාල වශයෙන් ජනතාවට ආහාර පාන ලබාදුන් අතර එම මොහොතේදී පක්ෂ භේදයක් නොමැතිව කටයුතු කළ බව පවසන ලදී. එමෙන්ම එම මොහොතේදී ආණ්ඩුව දැක්වූ සහයෝගය ප්‍රමාණවත් නොවන බව පැවසූ අතර පෙර ආපදාවකදී හෙක්ටර් අප්පුහාමි මැතිතුමා ගරු සභාපති වී සිටියදී අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා පළාත් සභා මන්ත්‍රීවරයා ලෙස කටයුතු කළ මොහොතේ දී උල්හිටියාව දේවස්ථානයේ සිටි 800 ක් පමණ ජනතාවට ආහාරපාන සැපයූ බව පවසන ලදී. මේ වන විට ආණ්ඩු පක්ෂයට ලංකා ඉතිහාසයේ ඕනෑම පණතක් වෙනස් කළ හැකි පළමු පාර්ලිමේන්තුව ලැබී ඇති බව පවසන ලදී. එමෙන්ම පෙර පාලන සමයේදී මන්ත්‍රීවරයකු ලෙස සිටි අමල් මහතා ද තෝප්පුව ප්‍රදේශයට පැමිණ ජනතාවට උපකාර කිරීමට කටයුතු කල අතර ඡන්දයෙන් පරාජය වී තිබියදීත් එම මහතා මානුෂිය ලෙස සිතමින් එම ස්ථානයට පැමිණි බව පවසන ලදි. එමෙන්ම තඹරවිල සහ ගොඩැල්ල අතර ජනතාව සිරවී සිටි බැවින් ඔවුන් සඳහාද ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මියගේ මැදිහත්වීම මත ආහාරපාන ලබා දීමට හැකි වූ බව පවසන ලදී. ඒ අනුව මෙම ආපදාවට මුහුණ දීමට ආණ්ඩු පක්ෂයට තිබූ අත්දැකීම ප්‍රමාණවත් නොවන බව පැවසූ අතර මීට වඩා යමක් කිරීමට තිබුණා යනුවෙන් පවසන ලදි.

ගරු මන්ත්‍රි ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මහතා කතා කරමින්, එම රථයට අණ දෙමින් අමල් මහතා තෝප්පුව ප්‍රදේශයේ රැඳී සිටි අතර එම ඩෝසරය අමල් මහතාගේ පෞද්ගලික ඩෝසරයක් නොවන බව පැවසූ අතර අදාළ ඡායාරූපද මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

සෝෂාව

ගරු මන්ත්‍රි ඩබ්.විමලසිරි පෙරේරා මහතා කතා කරමින්, අපේ යනුවෙන් කිසිම දෙයක් නොමැති බැවින් සභාව සතු සෑම දෙයක්ම ජනතාව සතු දේවල් බව පවසන ලදී. එමෙන්ම දික්වෙල පවුල 124ක් යෝගියාන පවුල් 76ක්, ජංකුරාවෙල පවුල් 127ක් හා ද/ඇටියාවල පවුල් 76ක් අවතැන් වූ මොහොතක පවුල් පැකට්ටුවක් ලබාදීමට කිසිදු අයෙක් නොසිටි බව පවසන ලදි. තම කොට්ඨාස භාර මන්ත්‍රීවරයා වූ ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා, ගරු මන්ත්‍රිනී පී.කේ.හසංකා සෙව්වන්දි දයාරත්න මියට හා ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මියට ස්තුතිය පුද කරන ලදි. එමෙන්ම ආපදාව අවස්ථාවේදී මෝටර් බෝට්ටුවක් ඉල්ලා සිටි නමුත් එය ලබා නොදුන් අතර පෞද්ගලික මුදලින් බෝට්ටුවක් රැගෙන ගොස් ජනතාව බේරාගත් බව පවසන ලදී. එහිදී පක්ෂ භේදයක් නොමැතිව කටයුතු කළ අතර විමලසිරිය යන චරිතය කිසි දිනක කුහක නොවන අතර මෙම නිලතල වලටද කිසි දිනක ප්‍රිය නොකරන බව පවසන ලදි.

ගරු මන්ත්‍රි එස්.ඒ.දීපාල් මහතා කතා කරමින්, ගංවතුර උවදුරට සියලු දෙනාම මුහුණ දුන් නමුත් මේ වන විට එය දේශපාලනීකරණය වෙමින් පවතින බව පවසන ලදී. මිනිසුන් සිතන පතන ආකාරය වෙනස් බැවින් ඔවුන්ට දෙයක් ලබා දුන් විට ආණ්ඩු පක්ෂයේ ගුණ වර්ණනා කරන අතර විපතක් සිදු වූ විට ආණ්ඩු පක්ෂයට

දෝෂාරෝපනය කරන අතර එය රටේ පොදු සංස්කෘතියක් බව පවසන ලදි. පැවැති ස්වභාවික විපත පිළිබඳ මහ සභාව ඇතුළත නොව එය එම විපතට පත් ගම් තුළට ගොස් සංවාද කළහොත් කුමන ආකාරයේ ප්‍රතිචාරයක් ජනතාවගෙන් ලැබේදැයි යන්න සිතාගත නොහැකි බව පවසන ලදී. ආණ්ඩු පක්ෂය මෙන්ම විපක්ෂයේ සියලු දෙනාගෙන්ම වැරදි අඩුපාඩුකම් සිදු වූ අත එය තීරණය කළ හැකිය ජනතාවට පමණක් බව පවසන ලදී. මීළඟට පැමිණීමට ඇති ව්‍යසනය ඩෙංගු වන අතර එයට කල්තියා සූදානම් විය යුතු බව පවසන ලදී. එමෙන්ම ඩෙංගු ව්‍යසනය පැමිණියහොත් අවශ්‍ය රෝහල් සකස් කරගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ කල්තියාම සැලසුම් කල යුතු බව පවසන ලදි. ඉදිරියේදිත් මෙවැනි ස්වාභාවික ආපදා සිදු විය හැකි බැවින් සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකටම බෝට්ටු 02 බැගින් තබා ගත යුතු බව පවසන ලදි. එමෙන්ම සිදු වූ ව්‍යසනය හමුවේ ආණ්ඩුවට බරපතල විවේචනයක් ඇති අතර “හැලියේ කුණු නැඹිලියෙන් වැසිය නොහැකි” බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය කතා කරමින්,  මැද ලුණුවිල ග්‍රාම සේවා වසමේ පවුල් 285 ක් ආපදාවට පත් වූ අතර වර්ෂාවේ තෙමී පක්ෂ භේදයක් නොමැතිව කටයුතු කළ අතර එතුමියගේ සැමියාද කාණු කපා ජලය ගලා යාමට අවශ්‍ය කටයුතු සූදානම් කළ බව පවසන ලදී. මෙහිදි ජලය බැස්සීමට බැකෝලෝඩරයක් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටි නමුත් එය නොලැබුණු අතර මීට පෙර පැවැති ආපදා කමිටුවකදිත් ඇලවේලි පවිත්‍ර කර දෙන ලෙස ඉල්ලා සිටියද අවශ්‍ය ආකාරයෙන් නොව, ඉතා සුළු ප්‍රමාණයකින් සුද්ද පවිත්‍ර කළ බව පවසන ලදී. නිවෙස්වල ජලය බැස යන තාක් බැකෝ යන්ත්‍ර ලබා නොදුන් අතර කාණු කපා තිබුණා නම් එම පවුල් ගංවතුර උවදුරෙන් මුදාගැනීමට තිබුණා යන්න පවසන ලදී. එහෙත් ඒ සඳහා කිසිදු සහයෝගයක් නොලැබීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන ලදී. පසුගිය ආපදා සමයේදී තමන් කාන්තාවක් වුවත් අළුයම 2.00ට  පමණ කානු කැපීමට ගොස් ප්‍රාදේශිය ලේකම් තුමිය සමඟ සාකච්ඡා කර එම කටයුතු කළ අතර එකල නිසි සැලසුමක් සහිතව සෑම දෙයක්ම සිදුකළ බව පවසන ලදි. එහෙත් මෙම ගංවතුර ආපදා තත්ත්වය තුළ කිසිදු සැලසුමක් නොමැතිව කටයුතු කර ඇති බව පැවසු අතර කොට්ඨාස භාර මන්ත්‍රීවරයා විසින් එතුමියගෙන් මීට පෙර පැවැති ආපදා සැලසුම් පිළිබඳ ප්‍රශ්න කළද වර්තමානයේ පැවති ආපදා සැලසුම පිලිබඳ ප්‍රශ්න කලද වර්තමානයේ පැවති ගංවතුර තත්වය තුල අදාල කටයුතු කිරීම ඉතා අසීරු බව එතුමාට වැටහෙන්නට ඇතැයි සිතන බව පවසන ලදි. එමෙන්ම පෞද්ගලිකව හෝ යන්ත්‍ර උපකරණ ලබාගෙන ආපදාවට මුහුණ දීමට තිබුනාය යනුවෙන් පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා කතා කරමින්, කුඩා ඇළ මාර්ගයක් සහ කුඩා ප්‍රමාණයක කාණුවක් කැපීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය විසින් චෝදන කල නමුත් සතියක් පමණ කාලයක් ගනිමින් එම කාණුව කැපූ බව පවසන ලදි. ආණ්ඩු පක්ෂය බලය ලබා ගත් මාස 06 තුල සෑම දෙයක්ම හොඳින් කළමනාකරණය කල අතර ලුණුවිල ජනපදය තුල පාරවල් දෙපස කාණු නොතිබුනු අතර ගරු උපසභාපතිතුමගේ දැනුවත් වීම මත යම් තාක් දුරට කාණු කපමින් ගිය මොහොතේදි මෙම ගංවතුර ව්‍යසනයට මුහුන දිමට සිදු වූ බව පවසන ලදි. මෙම ව්‍යසනය රටේ සිදු වූ දැවැන්ත ව්‍යසනයක් බැවින් කාණු කපා නැවතිය හැකි ව්‍යසනයක් නොවන බව පවසන ලදි. වාරිමාර්ග ඉංජිනේරුවරුන් පැවසු පරිදි ලංකාවේ ඇති සමස්ථ ජලාශවල ධාරිතාව ඝනමීටර බිලියන 06ක් වුවත් 2025.11.27 දින සිට දිස්ත්‍රික්ක 10කට ඝන මීටර බිලියන 5.2ක වර්ෂාපතනයක් ලැබී ඇති අවස්ථාවක ලුණුවිල වැනි ගම්මානයක් ගංවතුරෙන් යට වීම පුදුමයක් නොවන බව පවසන ලදි. එමෙනම එම ව්‍යසනයට මුහුන දුන් දින කිහිපය තුල උපරිම කැපවීමකින් යුතුව සියලු කටයුතු කලමනාකරණය කල අතර ඒ පිළිබඳ සත්‍ය දැනගැනීමට නම් ගමට ගොස් ජනතාවගෙන් අසා දැන ගන්නයි සියලු දෙනාටම ආරාධනය කරන ලදි. එක් නිවසකට පමනක් කල උදව් උපකාර පවසමින් ආණ්ඩු පක්ෂය විසින් කල සමස්ථ ක්‍රියාවලිය යටපත් කිරීමට උත්සාහ කලත් මිනිසුන් සත්‍ය දන්නා බව පවසන ලදි. ගස් වැටීම නිසා මාර්ග 07ක් අවහිර වී තිබු බැවින් තමන් පෞද්ගලිකව මැදිහත් වී එම ගස් ඉවත් කර ජනතාවට අවශ්‍ය ගමනාගමන පහසුකම් සලසා දුන් බව පවසන ලදි. එමෙන්ම එක් වේලකට කෑම 600ක පිසිය හැකි මුළුතැන්ගෙයක් සකස් කල අතර එක් අයෙක්වත් කුසගින්නේ නොතබා කටයුතු කල බව පවසන ලදි. ප්‍රාදේශිය සභාවේ නිලධාරි මණ්ඩලයේ කමිටුවක් පත් කර ලුණුවිල කොට්ඨාසයට ගොස් ජනතාවගෙන් අදහස් විමසන ලෙසට යෝජනා කරන ලදි.

දින ගණනක් මෙලෙස මහන්සි වී ජනතාව වෙනුවෙන් කටයුතු කල නමුත් කිසිදු අයෙකුගෙන් චෝදනා ඇසීමට අකමැති බව පවසන ලදි. මිනිසුන් චෝදනා නගන්නේ නම් එය භාර ගැනී◌ීමට ඉදිරිපත් වන නමුත් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වූවන්ගේ චෝදනා භාර ගැනීමට සූදානම් නොවන බව පවසන ලදි.

සෝෂාව

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා කතා කරමින්, ආපදා තත්වය මුළු දිවයිනටම අඩු වැඩි වශයෙන් බලපෑ අතර වෙන්නප්පුව ප්‍රදේශයෙ තුල එම ආපදාව අඩු කර ගැනීමට මෝය කපා ජලය බැස්සවීමට සෑම විටම කටයුතු කල නමුත් මෙම ගංවතුර ආපදාවේදි මෝය කැපීමට පමා වී ඇත්තේ මන්දැයි විමසන ලදි. කම්මල ප්‍රදේශයේ සිටින ලාල් මහතා සහ තරුණ පිරිස එක් කර ගනිමින් පෞද්ගලික බැකෝයන්ත්‍රයක් මිලදි ගනිමින් මෝය කැපූ අතර ඒ සඳහා විශේෂ ස්තූතියක් කල යුතු අතර ඔවුන් එසේ නොකලේ නම් මෙම ආපදා තත්වය තව තවත් වැඩි වන්නට තිබුනා යනුවෙන් පවසන ලදි. එමෙන්ම ප්‍රාදේශය සභාවේ ලේකම්තුමාටද විශේෂ ස්තුතියක් පුද කරන ලදි. එහෙත් ජනතාව අතර මේ වන විට ප්‍රාදේශය සභාව අසමත් යනුවෙන් මතයක් ගොඩ නැගී ඇති බව පවසන ලදි.

ගරු සභාපතිතුමා කතා කරමින්, යෞවන සමාජය විසින් ප්‍රාදේශය සභාව ඉදිරිපිට වියලි ආහාර රැස් කල අතර එම භාණ්ඩ තබා ගැනීමට ප්‍රාදේශය සභාවේ ශ්‍රවනාගාරය වෙන කර ගත් බව පැවසූ අතර ඔවුන් රැස් කර ගස් සියලුම භාණ්ඩ ඔවුන් විසින්ම ජනතාවට ලබා දුන් අතර ඔවුන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් පමණක් ඔවුන්ගේ ඉල්ලීම පිරිදි ඔවුන්ට ලබා දුන් බව පවසන ලදි. එමෙන්ම සුදුසු මොහොතේ මෝය කැපීම සිදු කල අතර ඒ වන තෙක් කිසිදු නිවසක් යට වී නොතිබුනු බව පවසන ලදි. මේ පිලිබඳ ආපදා කලමනාකරණ ඒකකයේ ප්‍රාදේශය ලේකම් තුමියද සාක්ෂි දරණ බව පවසන ලදි. මෙම ආපදාවේ ප්‍රමාණය කිසිදු අයෙක් තේරුම් නොගන්නා අතර ගරු මන්ත්‍රී එස්.ඒ.දීපාල් මයා පමණක් මධ්‍යස්ථව මෙම ආපදාව පිළිබඳ කතා කල බව පවසන ලදි. එමෙන්ම හිටපු මන්ත්‍රිවරු මෙන්ම අනෙතුක් මන්ත්‍රිවරුන්ගේ ඉල්ලීම් අනුව අවශ්‍යතා ලබා දුන් අතර ඇතැම් අවස්ථාවලදි පවතින ධාරිතාව අනුව සම්පත් සීමිත බැවින් සමහර ඉල්ලීම් මගහැරුනු බව පවසන ලද. එමෙන්ම බෝට්ටු ලබා දීම පිලිබඳව ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මයාටද විශේෂ ස්තුතියත් පුද කරන ලදි. එමෙන්ම බෝට්ටු ලබා ගැනීමේදි පළාත් ප්‍රධාන ලේකම් තුමට සහ පළාත් පාලන කොමසාරිස්තුමිය විසින් බෝට්ටු හා එන්ජින් මිලදි ගෙන ජනතාව මුදා ගන්නා ලෙසට උපදෙස් ලබා දී තිබූ බව පවසන ලදි. එමෙන්ම දින 02ක් මුළුල්ලේ කාර්යමණ්ඩලයේ මහත්ම මහත්මීන් වේල් 07ක් ප්‍රාදේශිය සභාව තුල ඉවුම් පිහුම් සිදු කල බව පවසන ලදි. සියලුම මන්ත්‍රිවරු අදාල කොට්ඨාසවල මෙම ආපදාව කලමනාකරණය කල අතර ස්වෙච්ඡා සංවිධාන හා ආගමික නායකයන්ද ඒ සඳහා දායක වූ බව පවසන ලදි. මෙය අප රටේ පවතින සංස්කෘතික ගුණයක් බව පවසන ලදි. එමෙන්ම ඉදිරියේදි මෙම ව්‍යසනයට මුහුණ දුන් ජනතාව වෙනුවෙන් කල යුතු දෑ පිළිබඳ සාකච්ඡා කිරීම සුදුසු බවට යෝජනා කරන ලදි. විවේචනයන් පසෙක තබා ප්‍රජාව වෙනුවෙන් කටයුතු කිරීම සුදුසු වන අතර මෙවැනි ව්‍යසනයක් දැරීමට ලෝකයේ කෙතරම් දියුණු රටකට වූවද නොහැකි බව පවසන ලදි.

15) අඩු ආදායම් ලාභි පූර්ව ප්‍රසව මව්වරුන් 30 දෙනෙකු සඳහා මෙවලම් කට්ටල් ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රිවරුන්ගේ හා මන්ත්‍රිවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| වෙන් කර ඇති මුදල රු. | එක් මෙවලම් කට්ටලයක මිල රු |
|---|---|
| 300,000.00 | 10,000.00 |

ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය විසින් අයවැය තුලදි කතා කල කරුණ සලකා බලා ඉහත ඉදිරිපත් කර ඇති යෝජනාව සම්බන්ධයෙන් ස්තූතිය පුද කරන ලදි. මව්වරුන් 30 දෙනා අතරින් අදාල අඩු ආදායම් ලාභි 15 දෙනා තෝරා ගන්නෙ◌් කෙසේද යන්න විමසන ලදි.

ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල මඟින් අදාල අඩු ආදායම් ලාභී මව්වරුන් 15 දෙනා දෙන බවයි.

16) සෞඛ්‍ය කම්කරුවන් සඳහා සෞඛ්‍ය සායනය පැවැත්වීමට ඉදිරිපත් කර ඇති රු.63,750.00ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

17) වෛද්‍ය ආධාර සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

I. ඒ.සුරීනා නිසාලි - ද/උල්හිටිහාව,රෙජිස්ටිනා වත්ත, වෙන්නප්පුව - රු.25,000
II. එච්.ලලිත් ධර්මප්‍රිය - මහයායවත්ත,කහටවිල,පොතුවටවන - රු.25,000

18) කමිටු රැස්වීම වලට සහභාගි නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| අනු අංකය | මන්ත්‍රීවරයාගේ නම | කාරක සභාව/මහ සභාව | දිනය |
|---|---|---|---|
| 1 | ගරු උප සභාපති එස්.ඒ.ඩී.ලාල් ප්‍රියන්ත සියඹලාපිටිය මයා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 2 | ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 3 | ගරු මන්ත්‍රී එම්.සුරංග රනිල් ක්‍රිෂාන්ත ප්‍රනාන්දු මයා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 4 | ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මහතා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 5 | ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 6 | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 7 | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මයා | මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 8 | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා | කාර්මික සේවා කාරක සභාව | 2025.11.18 |
| 9 | ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 10 | ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 11 | ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 12 | ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා | පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභාව | 2025.11.20 |
| 13 | ගරු මන්ත්‍රී සුධීර ප්‍රදීප් රණසිංහ මයා | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා | 2025.11.21 |

| | | | |
|---|---|---|---|
| | | කළමනාකරණ කාරක සභාව | |
| 14 | ගරු මන්ත්‍රී ආර්.එම්.ශ්‍යාම් පෙරේරා මයා | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව | 2025.11.21 |
| 15 | ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව | 2025.11.21 |
| 16 | ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව | 2025.11.21 |
| 17 | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව | 2025.11.21 |
| 18 | ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරාංගනී පෙරේරා මිය | පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව | 2025.11.21 |
| 19 | ගරු මන්ත්‍රී කේ.එල්.ඩී.ජී.සංජය අප්පුහාමි මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.11.24 |
| 20 | ගරු මන්ත්‍රී ජේ.පී.උපාලි සඳසිරි මයා | ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව | 2025.11.24 |
| 21 | ගරු මන්ත්‍රී ආර්.එම්.අජිත් උදයසිරි රණතුංග මයා | මහ සභාව | 2025.12.16 |
| 22 | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.ෂවීන් ප්‍රනාන්දු මයා | මහ සභාව | 2025.12.16 |
| 23 | ගරු මන්ත්‍රී ඩබ්.දිනේෂ් සංජීව ප්‍රනාන්දු මයා | මහ සභාව | 2025.12.16 |
| 24 | ගරු මන්ත්‍රිනී ඒ.එම්.මනෝරි එරන්දති මිය | මහ සභාව | 2025.12.16 |
| 25 | ගරු මන්ත්‍රී ජගත් කීර්ති කුමාර අබේරත්න මයා | මහ සභාව | 2025.12.16 |

19) ප්‍රජා ජල ව්‍යාපෘතියක් සඳහා තුලාවල පිහිටි පර්චස් 18ක රජයේ ඉඩමක් දීර්ඝ කාලීන බදු ක්‍රමයට ලබා දීම ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

20) වෙන්නප්පුව නව වාණිජ බහු කාර්ය ගොඩනැගිල්ලේ පළමු මහල අංක 06 කඩකාමරය එච්.සුජීව සඳරුවන් මහතා විසින් එම්.පී.ඒ.එස්. එරන්දි ප්‍රනාන්දු මහත්මිය වෙත පවරා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

21) 7 වන පරිපූරක ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි කේ.බී.වරුණ පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

**07 වන පරිපූරක ඇස්තමේන්තුව - 2025 වර්ෂය**

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**

| ආදායම් උපයා ගන්නා අය විෂය | | | | ප්‍රතිපාදන වෙන් කරන වැය විෂය | | | |
|---|---|---|---|---|---|---|---|
| **වැඩසටහන** | **අය විෂය** | **අය විෂය විස්තරය** | **ආදායම් ඇස්තමේන්තුව** රු. ශත | **වැඩසටහන** | **වැය විෂය** | **වැය විෂය විස්තරය** | **වියදම් ඇස්තමේන්තුව** රු. ශත |
| භෞතික සැළසුම් | 281-03-00-00-72-i (සේවා ආධාර) | දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත් මාර්ග අළුත්වැඩියාව සඳහා ප්‍රතිපාධන ලැබීම(පළාත් පාලන දෙපාර්තමේන්තු ආධාර) | 8,973,000.00 | භෞතික සැළසුම් | 281-03-00-00-04-07 | මංමාවත්/පදික වේදිකා පාලම් කාණු අළුත්වැඩියාව | 8,973,000.00 |
| සෞඛ්‍ය සේවා | 281-02-00-00-81-i | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන (ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය) | 1,900,000.00 | සෞඛ්‍ය සේවා | 281-02-03-00-09-01 | ග්‍රාමීය කසළ එකතු කිරීමේ මධ්‍යස්ථානය ඉදි කිරීම | 1,900,000.00 |
| භෞතික සැළසුම් | 281-03-00-00-72-i (සේවා ආධාර) | පළාත් සභා ආධාර (හදිසි ස්වභාවික ව්‍යසනය හේතුවෙන් ජන පීවිත යථාවත් කිරිමට ආධාර ලැබීම) | 2,766,098.00 | භෞතික සැළසුම් | 281-03-00-00-05-09(ii) | වෙනත් සේවා (ආපදා කළමණාකරනය) | 2,766,098.00 |
| එකතුව | | | **13,639,098.00** | | එකතුව | | **13,639,098.00** |

22) බදු ලබා නොගත් දේපලවල 2026 අවම ලංසුව 2025 ජයග්‍රාහි ලංසුව දක්වා පහත හෙලීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැඳී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| | කේතය | අ.අ | දේපල විස්තරය | 2025 ජයග්‍රාහී ලංසුව | 2026 අවම ලංසුව |
|---|---|---|---|---|---|
| | **දේපළ බදු දීම - 2026** | | | | |
| | **බදු නොගත් දේපළ** | | | | |
| | **වෙන්නප්පුව ප්‍රධාන කාර්යාලය** | | | | |
| 1 | WHO/R/M/01 | 1 | වෙන්/වෙළඳ සංකිර්ණයේ ගව / ඌරු මස් වෙළඳ සැල | 390,013.00 | 486,000.00 |
| 2 | WHO/R/M/04 | 2 | වෙන්/වෙළඳ සංකිර්ණයේ අංක 07 කුකුළු මස් වෙළඳ සැල | 15,300.00 | 100,000.00 |
| 3 | WHO/R/M/05 | 3 | කඩවත මස් වෙළඳ සැල | 150,012.00 | 160,000.00 |
| 4 | WHO/R/M/06 | 4 | නුගගහමුල්ල මස් වෙළඳ සැල | 150,012.00 | 190,000.00 |
| 5 | WHO/R/M/08 | 6 | කොළින්ජාඩිය මස් වෙළඳ සැල | 300,000.00 | 335,000.00 |
| 6 | WHO/R/M/09 | 7 | ගොරොකගස් හන්දිය අංක 19 මස් වෙළඳ සැල | 210,020.00 | 250,000.00 |
| | **දංකොටුව උප කාර්යාලය** | | | | |
| 7 | WDK/R/M/01 | 1 | දංකොටුව පොදු වෙළඳපල කුකුල් මස් වෙළඳ සැල | 170,000.00 | 170,000.00 |
| 8 | WDK/R/M/03 | 3 | ගෝනවිල පොදු වෙළඳපල අංක 05 මස් වෙළඳ සැල | 60,010.00 | 75,000.00 |
| 9 | WDK/R/M/04 | 4 | දංකොටුව ගව මස් හා ඌරු මස් වෙළඳ සැල | 1,350,000.00 | 1,350,000.00 |
| 10 | WDK/R/H/10/A | 12 | ඇටියාවල එස්ටේට් ප්‍රාදේශීය සභා පොදු ඉඩම I | 13,400.00 | 13,400.00 |
| 11 | WDK/R/H/10/B | 13 | ඇටියාවල එස්ටේට් ප්‍රාදේශීය සභා පොදු ඉඩම II | 16,610.00 | 16,610.00 |
| | **කම්මල්පත්තුව උප කාර්යාලය** | | | | |
| 12 | WKM/R/M/02 | 1 | මිරිස්සන්කොටුව මස් වෙළඳ සැල | 43,000.00 | 41,000.00 |
| 13 | WKM/R/M/03 | 2 | තඹරවිල රා තැබෑරුම අසල මස් වෙළඳ සැල | 15,000.00 | 17,000.00 |
| 14 | WKM/R/M/05 | 4 | වයික්කාල හන්දිය අංක 03 මස් වෙළඳ සැල | 840,252.00 | 1,170,000.00 |
| 15 | WKM/R/M/08 | 6 | බෝලවත්ත අංක 06 මස් වෙළඳ සැල | 240,252.00 | 286,000.00 |
| 16 | WKM/R/M/09 | 7 | මිරිස්සන්කොටුව හන්දිය අංක 08 මස් වෙළඳ සැල | 60,150.00 | 75,000.00 |
| 17 | WKM/R/M/10 | 8 | බොරලැස්ස අංක 09 මස් වෙළඳ සැල | 240,030.00 | 257,000.00 |
| 18 | WKM/R/M/11 | 9 | හණතොටුපල හන්දිය අංක 10 මස් වෙළඳ සැල | 211,040.00 | 760,000.00 |
| 19 | WKM/R/M/12 | 10 | නයිනමඩම මුට්ටුව අංක 12 මස් වෙළඳ සැල | 150,240.00 | 171,000.00 |
| 20 | WKM/R/M/14 | 12 | තල් දෙක අංක 22 මස් වෙළඳ සැල | 126,030.00 | 142,000.00 |
| 21 | WKM/R/M/16 | 14 | තල්දෙක ප්‍රදේශයේ අංක 24 මස් වෙළඳ සැල | 120,240.00 | 132,500.00 |
| 22 | WKM/R/T/01 | 18 | තෝප්පුව හන්දිය සනීපාරක්ෂක වැසිකිලි පද්ධතිය | 12,000.00 | 12,000.00 |
| | **කිරිමැටියාන උප කාර්යාලය** | | | | |
| 23 | WKR/R/M/01 | 1 | කිරිමැටියානවත්ත අංක 05 මස් වෙළඳ සැල | 600,030.00 | 670,000.00 |
| 24 | WKR/R/M/03 | 3 | ගාලවත්ත පොදු වෙළඳපල මස් වෙළඳ සැල | 120,020.00 | 120,020.00 |
| 25 | WKR/R/M/05 | 5 | හාල්දඩුවන මස් වෙළඳ සැල (නව) | 182,000.00 | 209,000.00 |
| 26 | WKR/R/H/01 | 10 | ලුණුවිල ජය මාවතේ මිලාන් ටවුන් (56 පොල් එළදාව) | 71,910.00 | 71,910.00 |
| 27 | WKR/R/H/03 | 11 | බෝතලේගම මෙට්‍රො ලැන්ඩ් ඉඩමේ පොල් එළදාව | 15,100.00 | 15,100.00 |
| 28 | WKR/R/H/04 | 12 | කහටවිල යුනිවර්සල් ලැන්ඩ් ඉඩමේ පොල් එළදාව | 12,500.00 | 12,500.00 |
| 29 | WKR/R/H/12 | 15 | කහටගහඕවිට, කිරිමැටියාන වත්ත | 17,800.00 | 17,800.00 |

23) 2025 නත්තල් උත්සවය වෙනුවෙන් වෙන් කල මුදලින් මුදල පූර්ව ළමා සංවර්ධන අධිකාරිය යටතේ පවතින පෙරපාසල් වල ආපදා තත්වය නිසා විපතට පත් වී සිටින දරුවන් සඳහා රු.399,420.00ක පාසල් උපකරණ ලබා දීම සඳහා අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සංදීප් මයා විසින් ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු මෙම යෝජනාව ඡන්ද විමසීමකින් තොරව සභාවේ රැදී සිටි සියලුම මන්ත්‍රීවරුන්ගේ හා මන්ත්‍රීවරියන්ගේ එකඟතාවයෙන් සම්මත විය.

| අ/අ | ද්‍රව්‍ය නාමය | වර්ගය | ප්‍රමාණය | මුදල |
|---|---|---|---|---|
| 1 | ගල් ලෑල්ල සමඟ ගල් කූර | gihini | 80x495 | 39,600.00 |
| 2 | පාට පැන්සල් 12 | zero | 140x195 | 27,300.00 |
| 3 | පැස්ටල් 24 | Ten | 140x270 | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 37,800.00 |
| 4 | චිත්‍ර පොත් 40p | Ten | 140x92 | 12,880.00 |
| 5 | තුඩ සහිත බයින්ඩර් ගම් බෝතල් 100g | Chemifix | 140x130 | 18,200.00 |
| 6 | ක්ලේ කැලි 12 | | 140x105 | 14,700.00 |
| 7 | අකුරු කට්ටලය | | 80x145 | 11,600.00 |
| 8 | ඉලක්කම් කට්ටලය | | 80x175 | 14,000.00 |
| 9 | හිඩැස් පත් | Susara | 80x450 | 36,000.00 |
| 10 | අහල් 5 කතුර | | 140x57 | 7,980.00 |
| 11 | රේන්බෝ A4 ජායි පිටපත් කඩදාසි 100 පැකට් | Natru | 140x360 | 50,400.00 |
| 12 | ගණකරාමු වක්‍රාකාර | | 80x580 | 46,400.00 |
| 13 | බිල්ඩිං බ්ලොක්ස් (M.L) | M390/L390 | 80x390 | 31,200.00 |
| | | | 80x530 | 42,400.00 |
| 14 | මකන කැලි | | 140x16 | 2,240.00 |
| 15 | පැන්සල් | | 280x24 | 6,720.00 |
| | එකතුව | | | 399,420.00 |

**5. කාරක සභා වාර්තා සලකා බැලීම.**

a) 2025.11.20 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

b) 2025.11.18 දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

c) 2025.11.20 දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් පිළිබඳ කාරක සභා වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

d) 2025.11.24 දින පැවති ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව

ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය කතා කරමින්, සති කිහිපයකට පෙර දංකොටුව පෙර පාසලේ පැවති උත්සවයකට සහභාගි වූ අවස්ථාවේ ආණඩු පක්ෂයේ සාමාජිකයෙකු විසින් ගරු මන්ත්‍රිනී කේ.ඒ.ඩී.ශ්‍රීමාලි ඉන්ග්‍රීට් මිය, ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය හා ගරු මන්ත්‍රිනී ආර්.පී.මෙලනි චතුරිකා රන්තිලක මිය අපහසුතාවයට පත් වන ආකාරයෙන් කතා කිරීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන ලදි. මින් ඉදිරියට මෙවැනි දෙයක් සිදු වන්නට ඉඩ නොතබන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු සභාපතිතුමා විසින් එම මොහොතේ එම මන්ත්‍රීවරියන් තිදෙනාට සිදු වූ අපහසුතාවය පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා විසින් නත්තල් උත්සවය පැවැත්වීම පිළිබඳ මහ සභා තීරණයක් ගෙන ඇති නමුත් පැවති ආපදා තත්වය හමුවේ ඉදිරි වැඩකටයුතු එලෙසම පවත්වනවාද නැතහොත් එම වැඩසටහන් අවලංගු කරනවාද යන්න විමසන ලදි.

ගරු මන්ත්‍රී ඒ.ඒ.වොහාන් සන්දීප් මයා කති කරමින්, වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව යටතේ පවතින පෙර පාසල්වල අවතැන් වූ සියලුම දරුවන්ට අවස්ථා 03කදි අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කල අතර සැලකිය යුතු ප්‍රමාණයකින් එය කිරීමට හැකි වූ බව පවසන ලදි. එම මුදල් ප්‍රාදේශිය සභා ප්‍රතිපාදන නොවන අතර ප්‍රජා සංවර්ධන නිලධාරි සමන්ත විජේතුංග මහතාගේ මැදිහත්වීම මත විවිධ ආයතන සම්බන්ධ කර ගනිමින් අදාල දරුවන්ට හා දෙමාපියන්ට අවශ්‍ය පහසුකම් සැලසූ අතර ඒ සඳහා විශාල වෙහෙසක් දැරූ ප්‍රජා සංවර්ධන නිලධාරි සමන්ත විජේතුංග මහතාට ස්තූතිය පුද කරන ලදි.

ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මයා පවසා සිටියේ කුඩා දරුවන්ගේ ප්ලාස්ටික් පුටු 40ක් පමණ ඇති බැවින් අවශ්‍ය තැන් වලට පරිත්‍යාග කිරීමට කැමති බව පවසන ලදි.

e) 2025.11.21 දින පැවති පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභාව.

ගරු මන්ත්‍රී කේ.වී.සුසන්ත පෙරේරා මයා විසින් වෙන්නප්පුව සතිපොළෙහි වර්තමාන තත්වය පිළිබඳ විමසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ මීළග වසර සිට වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව මඟින් සතිපොළ ගාස්තු අයකර ක්‍රියාත්මක කිරීමට මහසභාව මගින් තීරණය කර ඇති බව පවසන ලදි. එමෙන්ම නඩු සම්බන්ධයෙන් දෙසැම්බර් 31ට වාරණ නියෝගයක් ලැබී ඇති බැවින් එයින් පසු ගිවිසුම අවලංගු වන බව පවසන ලදි. ඒ අනුව නඩුව හා ගිවිසුම අතර සම්බන්ධයක් නොමැති බව පවසන ලදි. එමෙන්ම නඩු ගොනු කිරීම පිළිබඳ තාක්ෂණික දෝෂයක් ඇති බවද පවසන ලදි.

f) 2025.11.04, 2025.11.12, 2025.11.21 සහ දින පැවති ටෙන්ඩර් කමිටුව

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා පවසා සිටියේ භාණ්ඩ පිළිබඳ සඳහන් කිරීමේදි එම භාණ්ඩයේ වර්ගය හා නිෂාපාදිත රට ටෙන්ඩර් කමිටු වාර්තාවේ සඳහන් කරන ලෙස ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා පවසා සිටියේ මැක්සිස් ආයතනයෙන් මෝටරයක් මිලදි ගෙන ඇති අතර එහි නිෂ්පාදිත රටක් සඳහන් වී නොමැති බව ප්‍රකාශ කර සිටින ලදි. එමෙන්ම තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතියක් නොමැතිව ටෙන්ඩර් කමිටුවේ අනුමැතිය පමණක් සඳහන් වී ඇති බව පවසන ලදි.

එමෙනම කොලින්ජාඩිය ප්‍රජාශාලාවෙහි ගසක් කඩා වැටී ඇති අතර ඒ පිළිබඳ ආපදා කලමනාකරණ කමිටුව, පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභා තීරණයක් හෝ මහ සභා තීරණයක් තිබිය යුතු නමුත් ටෙන්ඩර් කමිටුවට තීරණ ගැනීමට බලයක් ලබා දී නොමැති බව පවසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ ඇතැම් හදිසි අවශ්‍යතා මත එවැනි තීරණයක් ගැනීමට සිදු වූ බවයි.

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මයා පවසා සිටියේ ටෙන්ඩර් මණ්ඩලයට බලය පවරා ඇති කරුණු 03ට පිටතින යා නොහැකි අතර ගරු සභාපිතිතමාගේ අභිමතය පිරිදි කටයුතු කල හැකි බවයි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ තනිවම කිසිදු තීරණයක් නොගන්නා අතර අවශ්‍යතාවය මත ගන්නා තීරණ විනිවිදභාවයකින් යුතුව සියලුදෙනාගේම දැන ගැනීම පිනිස වාර්තාගත කරන බවයි.

ගරු මන්ත්‍රිනී ජේ.ඒ.ඩී.ජසින්තා ඉන්ද්‍රානි මිය පවසි සිටියේ පෙර පාසල් සඳහා ලිපිද්‍රව්‍ය මිලදි ගැනීමක් ටෙන්ඩර් කමිටු වාර්තාවේ සඳහන් වී ඇති අතර එම ද්‍රව්‍ය කොළඹින් මිලදි ගතහොත් අඩු මුදලකට ලබා ගත හැකි බව පවසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ මිල ගණන් දැනුම් දී ඇත්තේ ලියාපදිංචි වී සිටින සැපයුම්කරුවන්ට බැවින් ඉදිරියේදි සැපයුම්කරුවන්ගේ ප්‍රමාණය වැඩි කර ගත යුතු බව පවසන ලදි. එමගින් මිල ගණන් සඳහා 2026 වර්ෂය සඳහා හොඳ තරගයක් තිබෙනු ඇතැයි පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා විමසා සිටියේ ලියාපදිංචි වී නොමැති සැපයුම්කරුවන්ට ටෙන්ඩර් ලබා දී තිබේද යන්නයි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ බල ප්‍රදේශයෙන් තුල ලියාපදිංචි නොමැති ටෙන්ඩර්කරුවන්ගෙන් විවෘතව කැදවීමක් කල හැකි බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා යෝජනා කර සිටියේ වර්ෂය අවසාන වන විට ලියාපදංචි කාල සීමාව අවසන් වීමට පෙර එම කිල සීමාව මතක් කිරීම සඳහා සැපයුම්කරුවන්ට කෙටි පණිවිඩයක් ලබා දීම සුදුසු බවයි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ අදාල ලියාපදිංචිකරුවන්ව දැනුවත් කරන නමුත් ඔවුන් එය යාවත්කාලීන කිරීමට නොපැමිණෙන බවයි. එමෙන්ම වෙන්නප්පුව බල ප්‍රදේශයේ 15%ක් පමණ වෙළඳ බලපත්‍ර නොමැති අතර ඒවා ලබාදීමට යාමේදී විවිධ ගැටලු මතුවන අතර ඒවා පෙර පාලන කාලවලදි සිදු වැරදි අඩුපාඩුකම් බවද පවසන ලදී.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා පවසා සිටියේ ඉදිරියේ විශාල ගැටලුවකට මුහුණ දීමට සිදුවන අතර ශිල්පීය ක්‍රමයට ගඩොල් 2000-2500ක් නිෂ්පාදනය කළ අතර පසුව චීනයෙන් ගෙන්වූ යන්ත්‍රයක් මගින් ගඩොල් නිෂ්පාදනය කිරීමට පටන් ගත් පසු ගඩොල් 8000ක් පමණ නිෂ්පාදනය කරන බව පවසන ලදී. එම යන්ත්‍රය මේ වන විට ලංකාවේ නිෂ්පාදනය කරන අතර කුඩා ගඩොල් හිමියන්ට ද එය මිලදී ගැනීමට අවස්ථාව ලැබෙන බව පවසන ලදි. එමෙන්ම මෙලෙස ගඩොල් නිෂ්පාදනය කිරීමේදී බැහැර වන අපද්‍රව්‍ය ළඟම ඇති ඇලකට හෝ කුඹුරකට මුදා හරින අතර එමගින් පරිසර දූෂණය ද සිදුවිය හැකි බව පවසන ලදි.
ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ පිළිබඳ භූ විද්‍යා හා පතල් කාර්යාංශය සමඟ සාකච්ඡා කර ඇති අතර එහි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් පවතින බවයි. සමහර වැලිමැටි කර්මාන්තය තුළ මාෆියාවක් පවතින බැවින් කුඩා කර්මාන්ත හිමියන් හා මහා කර්මාන්ත හිමියන් රැකගත යුතු බව පවසන ලදී.

ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මයා පවසා සිටියේ ප්‍රාදේශීය සභා ලාංඡනයේත් උළු සලකුණ පෙන්වා දී ඇති අතර උළු කර්මාන්තය වෙන්නප්පුව බල ප්‍රදේශයේ ප්‍රධානම දෙයක් වුවත් වර්තමානය වන විට මැටි කැපීමට තැනක් නොමැති අතර මැටි තිබෙන ප්‍රදේශය තහනම් කලාපයක් බවට පත් කර ඇති බව පවසන ලදි. මෙම කර්මාන්තය ඉදිරියට ගෙන යාමට නම් නීති රීති සංශෝධනය විය යුතු බව පවසන ලදී. ඒ අනුව මේ පිළිබඳ අවබෝධයක් ඇති අය පමණක් සාකච්ඡා වලට සහභාගි විය යුතු බව පවසන ලදී.

ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ සියලු දේ පිලිකාවක් ලෙස උඩුදුවා ඇති අතර දශක ගණනාවක් නිසි පියවර නොගැනීමේ ප්‍රතිවාපාක දකිමින් සිටින අතර මේ සැම දෙයක්ම ඉදිරියේදි අනිවාර්යෙන්ම වෙනස් කරන බව පවසන ලදි.

**6. ආදායම්/වියදම් වාර්තා හා වෙනත් වාර්තා සලකා බැලීම**

a) 2025 ඔක්තෝබර් මස වියදම් වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

b) 2025 ඔක්තෝබර් මස ආදායම් වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

c) ඔක්තෝබර් මස විදුලි පහන් නඩත්තුවට අදාල ප්‍රගති වාර්තාව.

ගරු මන්ත්‍රී බී. ඒ.එස්. සාන්ත පෙරේරා මයා විමසා සිටියේ වීදි පහන් ඉක්මනින් අක්‍රිය වන බැවින් ඒවා මිලදි ගන්නේ කාගෙනද යන්න විමසන ලදි.

ගරු සභාපතිතුමා පවසා සිටියේ අවම මිලට ලැබී ඇති වීදි පහන් ලබාගෙන ඇති අතර මේ පිළිබඳ නිරීක්ෂණය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර ඇති නමුත් ආම් සෙට් පැරණි බවත් ජලය වීදි පහන තුළට ගලා යාමත් නිසා වීදි පහන් ඉක්මනින් අක්‍රිය වන බව පවසන ලදි. එහෙත් එහි පවතින ගැටළුව තවම සනාථ කරගත නොහැකි අතර මේ පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමුකර නිගමනයකට එලැබීම සුදුසු බව පවසන ලදි.

ගරු මන්ත්‍රී කේ.අජිත් නිශාන්ත ප්‍රනාන්දු මයා පවසා සිටියේ වීදි පහන් විශාල ප්‍රමාණයක් ඇති බැවින් එහි ඇති ඇලුමිනියම් වයරය කොපර් වරයකින් අමුණා ඇති බැවින් සවි කිරීමේදි ප්‍රායෝගිකව ගැටලුව ඇති වන බැවින් එය තාවකාලිකව සම්බන්ධ කර ඇති නමුත් එහි අන්තර්ගතයේ ගැටලුවක් පවතින බව පවසන ලදී.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා විසින් එතුමා මීට පෙර ඉදිරිපත් කළ සෝලා ක්‍රමය පිළිබඳ අදහස් විමසන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පවසා සිටියේ ඒ වෙනුවෙන් වියදමක් දැරීමට මේ මොහොතේ හැකියාවක් නොමැති බවයි.

සමීර මහතා පවසා සිටියේ මේ සම්බන්ධයෙන් වැඩමුළුවක් පැවැත්වීම සුදුසු අතර මේ පිළිබඳ ගරු මන්ත්‍රී ඒ.එච්.ගාමිණි රෙක්ස් ප්‍රනාන්දු මයාට හොඳ දැනුමක් ඇති බැවින් එතුමාගෙන් අදහස් විමසා මේ පිළිබඳ වැඩපිළිවෙළක් සැකසීම සුදුසු වන අතර එසේ නොකර අඳුරේ අතපත ගෑම එලක් නොවන බව පවසන ලදි.

එහි පවතින නෛතිකභාවය පිළිබඳ පැහැදිලි කිරීම සඳහා ලේකම්තුමාට අවස්ථාවක් ලබා දීම සඳහා මහ සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී වයි.ටෙක්ලා ජයම්පති විජේසේකර මිය විසින් ස්ථිර කරන ලදි. ඉන්පසු ලේකම්තුමා විසින් මේ පිළිබඳ පැහැදිලි කරන ලදි. ඉන්පසු නැවත කාරක සභා අවස්ථාව මහ සභා අවස්ථාවක් බවට පත් කිරීමට ගරු මන්ත්‍රී කේ.බී.වරුණ පෙරේරා මයා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඩිහාන් මලිත් බ්‍රවුන්සන් ප්‍රනාන්දු මයා විසින් ස්ථිර කරන ලදි.

විදි ආලෝකකරණය පිළබඳ නව ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බැවින් ඒ සඳහා ගොඩනැගිලි හිමියන්ගේ සංගමය විසින් විදි පහන් 20-25ක් පමණ ලබා දී ඇති අතර වෙලඳ සංගමය විසින්ද ආධාර ලබා දුන් අතර තවත් විදි පහන් 50ක් පමණ ටෙන්ඩර කැඳවි මිලදි ගත් බව පවසන ලදි. එහෙත් පැවති ආපදා තත්වය නිසා එම කටයුත්ත අවසන් කිරීමට නොහැකි වූ බව පවසන ලදි.

g) ඔක්තෝබර් මස වාහන ධාවනයට අදාල වාර්තාව සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

h) 2025 ජනවාරි සිට ඔක්තෝම්බර් දක්වා මාසික අභ්‍යන්තර විගණන වාර්තා සලකා බැලූ අතර අදහස් ඉදිරිපත් කිරීමක් සිදු නොවීය.

**7. වෙනත් කරුණු**

ගරු මන්ත්‍රී එම්.පී.බ්‍රයන් පෙරේරා මහතා

i. වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව තුල අපට තිබෙන අභියෝග පිළිබඳ සාකච්ඡා කිරීම

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පණතේ 3 වන වගන්තිය යටතේ ප්‍රාදේශිය සභාවට කල යුතු දේවල් මොනවාද යන්න සඳහන් කර ඇති අතර ස්වාභාවික විපත් වලින් පසු අපට ඇති අභියෝග මොනවාද යන්න අවබෝධයක් ඇති වූ බව පවසන ලදි. එමෙන්ම මීළඟ වසර වන විට පැනනගින විශාල අභියෝගයක් වන්නේ ප්‍රාදේශිය සභාවට මුදල් උපයා ගැනීම බව පවසන ලදි. එම අභියෝගයන්ට සියලු දෙනාම එකට එක්වී මුහුණ දිය යුතු අතර පක්ෂයේ මන්ත්‍රිවරු 25 දෙනා පමණක් වෙනම සාකච්ඡා කිරීම නොව මන්ත්‍රිවරු 44 දෙනා එකට එක්වී සාකච්ඡා කල යුතු බව පවසන ලදි. එමෙන්ම ගරු සභාපතිතුමා විසින් මුලසුනේ සිට පෙර සිටි සභාපතිවරයාට සහ අනෙකුත් මන්ත්‍රිවරුන්ට අභියෝග කල අතර එම අභියෝගය කුමන ආකාරයේ අභියෝගයක්ද යන්න විමසන ලදි. මෙලෙස තනතුරෙන් පහල අයෙකුට අභියෝග කිරීම නුසුදුස වන අතර එවැනි දෑ සිදු නොකරන ලෙස ඉල්ලා සිටින ලදි. එමෙන්ම සැම විටම පක්ෂ භේදයක් නොමැතිව සැම විටම මන්ත්‍රිවරු 44 දෙනාම එකට එකතු වී සිටීම වැදගත් වන අතර අභයෝග සියලු දෙනාටම පොදු දෙයක් බව පවසන ලදි. එමෙනම පැවති අපදාවෙන් පසු එතුමාගේ නිවසද ගංවතුරට හසු වූ අතර තම නිවස සුද්ද පවිත්‍ර කිරිම පසෙක තබා ජනතාවට සේවය කිරීමට ගිය අතර සැම විටම වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව ඔසවා තැබීමට කටයුතු කල අතර කිසිදු විටක පෞද්ගලිකව ජනතාවගෙන් ප්‍රශංසා ලැබීමට අරමුණක් නොමැති බව පවසන ලදි.

ගරු මන්ත්‍රී ඩී.මලිත් සමීර පෙරේරා මයා

ආපදා තත්වය තුලදි තොරතුරු ලබා ගැනීමට කිසිදු අවස්ථාවක් නොලැබුනු අතර දින දෙකක් මුළුල්ලේ විදුලි සැලයුම ඇණ හිටි බැවින් සන්නිවේදනයේ දූර්වලතාවයක් තිබූ බව පවසන ලදි. ඉදිරියේදි නැවත ගංවතුර තත්වයක් ඇති විය හැකි අතර ගොඩැල්ල ගෝනවිල ගම්මාන ගංවතුරෙන් යට වීමේදි විශාල කාලයත් ගත වී තිබුනත් මිනිසුන්ව ඒ පිලිබඳව දැනුවත් කිරීමට හැකියාවක් නොතිබුනු බව පවසන ලදි. ඒ අනුව ආපදා කලමනාකරණ ඒකකය මීට වඩා ශක්තිමත් විය යුතු අතර රාජ්‍ය ආපදා කලමණාකරණ ඒකකය සමඟ සන්නිවේදනය ඒකාබද්ධ කරන වැඩපිළිවෙලක් සකස් කල යුතු බව පවසන ලදි.

ගරු මන්ත්‍රිනී අයි.නයෝමි රම්‍යලතා මිය

2025.12.02 වන දින ආපදා කලමනාකරණ කමිටුවට පැමිනෙමින් සිටියදි එතුමිය සහ එතුමයගේ සැමියා රිය අනතුරකට භාජනය වූ අතර එම මොහොතේ ගරු සභාපතිතුම, ලේකම්තුමා සහ ගරු මන්ත්‍රී ජී.ලලිත් ඔස්කා පෙරේරා මහතා සම්බන්ධ වී එම ස්ථානයට වාහනයක් එවූ බව පවසන ලදි. එම මොහොතේදි ගම්වාසින් එක්වී එතුමියව සහ සැමියාට රෝහල්ගත කර තිබූ බව පවසන ලදි. එමෙන්ම ප්‍රාදේශිය සභා මන්ත්‍රිවරුන් සහ මන්ත්‍රිවරියන්ද ප්‍රාදේශිය සභා නිලධාරින් දූරකථන ඇමතුම් ලබා දී සැපදුක් විමසූ බැවින් එම සියලු දෙනාටම ස්තුතිය පුද කරන ලදි. එමෙන්ම ගරු මන්ත්‍රී ඩී.මනෝජ් ඉන්දික මධුෂාන් පෙරේරා මහතා සහ ගරු මන්ත්‍රී ජී.එම්.සඳුන් මධුමාල් ගම්පහ මයා එම මොහොතේ අවශ්‍ය ස්ථානවලට දූරකථන ඇමතුම් ලබා දී අවශ්‍ය පහසුකම් ලබාදීම පිළිබඳව හෘදයාංගම කෘතවේදිත්වය පුද කරන ලදි.

ටි.බි.ඩි ඇන්ටනි කුමාර්
සභාපති,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.